**වයඹ පළාත් සභාව - 2016**

**-----------------------------**

වයඹ පළාත් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23 (2) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුළත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට

අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 පළාත් සභා අරමුදල

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

2.2.2 අනෙකුත් ගිණුම්

(අ) ආදායම් ගිණුම්

පළාත් මූල්‍ය රීති අනුව ආදායම් සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත බලය ලබාදී ඇති ගණන්දීමේ නිලධාරීන් විසින් තමාට අයත් ආදායම් ගිණුම් සකස් කර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළයුතු අතර, සමාලෝචිත වර්ෂය සඳහා පළාත්

සභාවේ ආදායම් සංකේතයන්ට අදාල ගිණුම් 26 ම 2017 මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) විසර්ජන ගිණුම් ඇතුලු අනෙකුත් ගිණුම්

--------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව 2017 අගෝස්තු 31 දිනට ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පහත දැක්වේ.

| | ගිණුමේ නම | 2016 වර්ෂයට අදාලව | | |
|---|---|---|---|---|
| | | මුළු ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව | ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව |
| (i). | විසර්ජන ගිණුම් | 28 | 28 | - |
| (ii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 78 | 78 | - |
| (iii). | පළාත් සභා මන්ත්‍රීවරුන්ට ණය පහසුකම් අත්තිකාරම් ගිණුම | 01 | 01 | - |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 07 | 05 | 02 |
| (v). | අරමුදල් හා ප්‍රඥප්ති ගිණුම් | 14 | 14 | - |
| (vi). | ආදායම් ගිණුම් | 26 | 26 | - |
| | එකතුව | 154 | 152 | 02 |

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013 ඔක්තෝබර් 02 දිනැති අංක 2013/03 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ආයතනවල ගිණුම් තැබීමේදී මුදල් පදනම නොව උපචිත පදනම උපයෝගී කරගත යුතු වුවද, වයඹ පළාත් සභාව එම නියමය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා දරන ලද එකතු වියදම වූ රු.4,685,181,532 ක් සහ පෙර වර්ෂවල මූලධන වත්කම් අත්පත් කර

ගැනීම සඳහා දරන ලද වියදම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර, ස්ථාවර වත්කම් ගිණුම් තැබීම සඳහා අනුගමනය කරනු ලබන ආයතනීය ප්‍රතිපත්ති පිළිබඳව හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

අනුමත අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා ණය ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.139,956,198 ක ශේෂයක් දක්වා ඇතත්, එම ශේෂය වාණිජ අත්තිකාරම් ගිණුම් වලින් ලැබිය යුතු සහ ගෙවිය යුතු වටිනාකම් එකිනෙකට හිලව් කිරීමෙන් පසුව වූ වටිනාකමක් බැවින් වත්කම් හා වගකීම්වල නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

2.2.5 ප්‍රතිපාදන කළමනාකරණය

--------------------------------

(අ) 260-03-04-2104 වැය විෂයය සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අතිරේකව පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගත් රු.8,469,330,000 ක ප්‍රතිපාදන වලින් රු.30,000,000 ක් පළාත් මූල්‍ය රීති 30 හා 32 මගින් වෙනත් වැය විෂයයකට මාරු කර තිබුණි.

(ආ) 260-03-04-2103 සහ 260-03-04-2104 වැය විෂයයන් සඳහා රු. 325,000,000 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලට අමතරව රු. 8,669,330,000 ක් පරිපූරක ඇස්තමේන්තු මගින් ලබාගෙන එයින් සියයට 80 කට ආසන්න රු.6,846,034,970 ක් ඉතිරි කර තිබුණි.

(ඇ) 2016 වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ශීර්ෂ 07 කට අදාලව අවස්ථා 15 ක් සඳහා ප්‍රතිපාදිත මුළු ශුද්ධ වටිනාකම වූ රු. 36,534,018 ක් සම්පූර්ණයෙන් ඉතිරි කර තිබූ අතර, ශීර්ෂ 16 කට අදාලව අවස්ථා 75 ක් සඳහා ප්‍රතිපාදිත මුළු වටිනාකම වූ රු. 12,802,244,547 කින් රු. 9,182,081,112 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. තවද ශීර්ෂ 10 කට අදාලව අවස්ථා 25 ක් සඳහා ප්‍රතිපාදිත රු. 73,063,350 ක් සම්පූර්ණයෙන්ම පළාත් මූල්‍ය රීති 30 හා 32 මගින් වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

(ඈ) 2016 වාර්ෂික මුදල් ප්‍රකාශය මගින් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණු වැය ශීර්ෂ 05 කට අදාලව අවස්ථා 11 ක් සඳහා රු.76,751,939 ක එකතු ප්‍රතිපාදන යොදා නව වැය විෂයයන් ඇතිකර ගැනීමට කටයුතු කර තිබූ අතර, ඉන් වැය ශීර්ෂ 02 ක වැය

විෂයයන් 03 ක් සඳහා සලසාගත් ප්‍රතිපාදනයෙන් සියයට 68 සිට සියයට 100 කට සමාන රු. 11,079,726 ක් ඉතිරි කර තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ වාහන නඩත්තුව සඳහා ඇස්තමේන්තුගත වියදම රු.3,500,000 ක් වුවද, 2016 දෙසැම්බර් 07 දින වන විට දැරූ වියදම රු.4,671,280 ක් වූයෙන් ප්‍රතිපාදන ඉක්මවා වැයකර තිබූ මුදල් රු.1,171,280 ක් විය.

(ඊ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 07/2015 දරන 2015 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව 1202 වැය විෂයය සඳහා ඇති කල ප්‍රතිපාදනයෙන් සියයට 15 කට සමාන මුදලක් අවුරා තැබිය යුතු අතර, ප්‍රධාන ලේකම් කාර්යාලය, අමාත්‍යාංශ 02 ක, හා දෙපාර්තමේන්තු 05 ක අවුරා තැබිය යුතු වටිනාකම රු. 6,477,000 ක් වුවත් සියයට 3 කට සමාන රු. 1,372,167 ක් පමණක් අවුරා තිබුණි.

2.2.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්
------------------

(i). ප්‍රධාන අමාත්‍යාංශය යටතේ අනුමත අත්තිකාරම් කටයුත්තක් ලෙස විස්කම් නිවස පවත්වාගෙන යාම සඳහා ලබාදී තිබෙන රු.7,038,211 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ii). කුලියාපිටිය සමූපකාර සහකාර කොමසාරිස් කාර්යාලයට අයත් විවිධ සේවා සමූපකාර සමිති 05 කින් සමූපකාර සංවර්ධන අරමුදලට ලැබිය යුතු රු.15,481,059 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii). සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මාදැල්පාඩු හිමිකරුවන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 364,000 ක්, ලුණු වෛක්කාල 167 කින් අයවිය යුතු රු. 3,680,128 ක් සහ ඉස්සන් ව්‍යාපෘතිය සඳහා අයවිය යුතු රු. 180,000 ක් වූ බදු කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv). පළාත් අමාත්‍යාංශ 04 ක, දෙපාර්තමේන්තු 13 ක, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක, කලාප අධ්‍යාපන කාර්යාල 07 ක සහ ප්‍රධාන ලේකම් කාර්යාලයේ ස්ථාන මාරු වී ගිය, මිය ගිය, සේවය හැර ගිය, වැඩ තහනම් වූ, විශ්‍රාම ගිය සහ

වෙනත් හේතු මත නිරවුල් නොවූ ණය ශේෂවල එකතුව රු.235,996,319 ක් විය.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

ප්‍රධාන ලේකම් කාර්යාලයට, කෘෂිකර්ම අමාත්‍යාංශයට, කලාප අධ්‍යාපන කාර්යාල 07 කට සහ දෙපාර්තමේන්තු 05 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ එකතු ණය ශේෂ රු.44,843,317 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අග්‍රිම ගිණුම්

---------------

ආයතන තුනක නොපිය වූ අග්‍රිම ශේෂ එකතුව රු.48,321,857 ක් විය.

(ඈ) පොදු තැන්පත්

------------------

(i). දිගුකාලීනව බදුගත් ඉඩමකට සින්නක්කර ඔප්පු ලබාගැනීමට සී/ස තම්මැන්නා ගාමන්ට් ආයතනය විසින් නිවාස සංවර්ධන අධිකාරියේ තැන්පත්කර තිබූ රු.300,000 ක් 2011 සැප්තැම්බර් 21 දින ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමට බැර කර තිබුණි. එකී මුදල ඉහත ආයතනයෙන් අයවිය යුතු දිගුකාලීන බදුවලට හිලව් කිරීමට අනුමැතිය 2016 වර්ෂයේ ලැබී තිබුණද, 2017 මාර්තු මාසය වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ii). පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවට පරිගණක මෘදුකාංග පද්ධතියක් සකස් කිරීම සඳහා ලැබී තිබූ රු.480,000 ක ප්‍රතිපාදනවලින් රු.240,000 ක් 2011 වර්ෂයේදී වයඹ සංවර්ධන අධිකාරියට ගෙවා තිබූ අතර, ඉතිරි රු.240,000 මුදල යොදවා අදාල කාර්යය සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකර 2017 මැයි 16 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iii). ජාතික පේෂකර්ම ප්‍රදර්ශනය වෙනුවෙන් 2013 වර්ෂයේදී මධ්‍යම රජයේ අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.198,500 ක මුදලට අදාල කාර්යය අවසන් කර තිබුණද, 2017 මැයි මාසය වන විටත් එම මුදල වයඹ පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(iv). සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම් කාර්යාලය, දෙපාර්තමේන්තු 05 ක, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල 02 ක සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක වර්ෂ 02 ඉක්මවූ එකතුව රු. 6,574,364 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v). 1990 වර්ෂයේ සිට තැන්පත් ගිණුමේ දැක්වෙන මාර්ගස්ථ මගී ප්‍රවාහන දෙපාර්තමේන්තුවට සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පියවිය යුතු රු. 426,404 ක් පියවීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| (i). 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 6 (1) අ උපවගන්තිය | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2016 වර්ෂයේදී එළඹ තිබුණු අදාල සීමාව ඉක්මවා තිබෙන එකතුව රු.246,609,662 ක් වටිනා කොන්ත්‍රාත් ගිවිසුම් 11 ක් සම්බන්ධයෙන් වූ ටෙන්ඩර්කරුවන් ලියාපදිංචි වී නොතිබුණි. |
| (ii). 2008 අංක 01 දරන සමූපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 21 වගන්තිය | සමූපකාර දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී එකතුව රු.25,237,500 ක මුදල් උපදේශක කාරක සභාවේ අනුමැතියකින් තොරව ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| (i). xiv වැනි පරිච්ඡේදයේ 8.1 සහ 8.1.2 උප වගන්ති | MN 5 වැටුප් තලයේ රු.16,720 ක් වූ ආරම්භක වැටුපක් හිමි පළාත් පාලන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ප්‍රජා සංවර්ධන නිලධාරිනියට සැතපුම් කුලී සඳහා හිමිකමක් නොතිබියදී 2013 ජනවාරි සිට 2016 දෙසැම්බර් දක්වා සැතපුම් කුලී වශයෙන් |

මාසිකව රු.7,680 බැගින් එකතුව රු.368,640 ක් ගෙවා තිබුණි.

(ii). xxiv පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය

සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තු 02 ක හා කලාප අධ්‍යාපන කාර්යාල 02 ක ආපදා ණය ලෙස එකතුව රු. 43,292,301 ක් ගෙවීම් කර ඇතත්, තම විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් ඒ වන විට ආපසු ගෙවීමට ඇති ණය ශේෂයන් අයකර ගැනීම සඳහා වූ අවලංගු කල නොහැකි මනාප ප්‍රකාශ ලබාගෙන නොතිබුණි.

(ඇ) වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය (ප.මූ.රී.)
-------------------------------

(i). ප.මූ.රී. 180.2

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් අදාල භාණ්ඩ ලබා ගැනීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දිනට රු.11,408,823 ක් වූ චෙක්පත් 34 ක් සැපයුම්කරුවන් වෙනුවෙන් ලියා තිබුණි.

(ii). ප.මූ.රී. 261.2.2

- නිකවැරටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරින් විසින් අවස්ථා 18 කදී ලබාගෙන තිබුණු රු. 1,011,150 ක් වූ අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි.
- නිකවැරටිය කලාප අධ්‍යාපන කාර්යාලය විසින් අවස්ථා 10 කදී කලින් ලබාගත් අතුරු අග්‍රිමයන් පියවා නොමැති නිලධාරීන් වෙත නැවත රු.884,500 ක අතුරු අග්‍රිම ලබාදී තිබුණි.
- එක් අවස්ථාවකදී ලබා දෙන අත්තිකාරම් මුදල රු.100,000 වැඩි නොවිය යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.400,000 ක අත්තිකාරම් මුදල් XIII වන ජාතික ක්‍රීඩා උළෙලේ කටයුතු සඳහා ලබා දී තිබුණි.

(iii). ප.මූ.රි. 476

පළාත් දෙපාර්තමේන්තු 03 ක හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් පාසල් 821 ක, පළාත් කාර්යාල/ මධ්‍යස්ථාන 35 ක සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ආයතන 98 ක සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ 2017 මාර්තු 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

-----------------------

2015 මාර්තු 10 දිනැති අංක 03/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛය

කුලියාපිටිය මූලික රෝහලේ සන්නිවේදන දීමනා ගෙවීමේදී 2015 සැප්තැම්බර් සිට 2016 සැප්තැම්බර් දක්වා ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට රු.757,500 ක් සහ II ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට රු. 1,267,500 ක් වශයෙන් රු.2,025,000 ක මුදලක් අනුමත සීමාව ඉක්මවා ගෙවා තිබුණි.

2.2.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ජීව වෛද්‍ය ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශයකින් තොරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 38 කදී රු.134,619,582 ක් වූ වෛද්‍ය උපකරණ මිලදී ගැනීම් සඳහා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබාදී තිබුණි.

(ආ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් රු.1,082,228 ක් වූ පොදු තැන්පතු ශේෂයක් අදාල තැන්පත් කිරීමේ කාර්යයෙන් පරිබාහිර කාර්යයන් සඳහා වියදම් දරා තිබුණි.

(ඇ) නිකවැරටිය මූලික රෝහලට තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව 2016 දෙසැම්බර් මාසයේදී රු.1,803,550 ක තීන්ත තොගයක් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදීගෙන තිබුණි.

(ඈ) ආණමඩුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෙක්ටයාර් 1.463 ක ඉඩම සහ එයට යාබදව පිහිටි රජයේ ඉඩම් හෙක්ටයාර් 4.047 ක් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීමේ

කටයුතු සිදු නොකර ආණමඩුව ප්‍රාදේශීය ලේකම්ගේ අභිමතය පරිදි නිවාස යෝජනා ක්‍රමයක් සඳහා නිවාස සංවර්ධන අධිකාරියට පවරා දී තිබුණි.

(ඉ) ඉඩම් සංවර්ධන ආඥා පනත සහ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/4 දරන චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් නොමැත්තන්ගෙන් අයදුම්පත්‍ර ලබාගෙන ඒ පිළිබඳ විරෝධතා පරීක්ෂා කර බලා සුදුසුකම්ලත් නාම ලේඛනය අනුමැතිය සඳහා පළාත් ඉඩම් කොමසාරිස්වරයා වෙත යැවිය යුතු විය. එහෙත් ආණමඩුව ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පුද්ගලයින් 20 දෙනෙකුගේ නාම ලේඛනයක් පමණක් යවා පළාත් ඉඩම් කොමසාරිස්ගෙන් ලබාගෙන තිබූ අනුමැතියක් මත පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචි බවට තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් නොමැති පුද්ගලයින් 13 දෙනෙකුට එක් අයෙකුට අක්කර 02 ක ඉඩම් කොටස බැගින් අවිධිමත් ලෙස ලබා දී තිබුණි. තවද, එකී බලපත්‍රවල හා අයදුම්පත්‍රවල අත්සන් එකිනෙකට පරස්පර විය.

(ඊ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 2.14.1 ජේදය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන තීරණ මත ගිවිසුම්වලට එළඹිය හැකි උපරිම සීමාව රු.2,000,000 ක් වුවද, එම සීමාව ඉක්මවා වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාරියපොල විධායක ඉංජිනේරුවරයා අවස්ථා 07 කදී එකතුව රු.21,796,720 ක් වූ මාර්ග නඩත්තු කිරීම් සඳහා අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ සැපයීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි.

## 03. ආදායම් කළමනාකරණය

-----------------------------

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ පළාත් සභාවේ එක් එක් ආදායම් සංකේත යටතේ ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් පහත දැක්වේ.

| | | 2016 | | 2015 | |
|---|---|---|---|---|---|
| ආදායම් සංකේත අංකය | ආදායම් විස්තරය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම |
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු.මිලියන |
| 10.02, 10.03 | නිෂ්පාදනය හා වියදම මත බදු | 6,653.00 | 6,555.69 | 5,450.00 | 5,658.70 |
| 20.02 | බදු කුලී, පොලී, ලාභ හා ලාභාංශ | 298.00 | 211.46 | 243.00 | 187.16 |
| 20.03 | විකුණුම් හා ගාස්තු | 540.00 | 613.06 | 472.00 | 536.64 |
| 20.06 | ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම | 25.00 | 2.32 | 10.00 | 0.23 |
| | එකතුව | 7,516.00 | 7,382.53 | 6,175.00 | 6,382.73 |

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පළාත් මූල්‍ය රීති 41.1.4 වගන්තිය ප්‍රකාරව තාත්වික හා නිවැරදි ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරීන් කටයුතු නොකිරීම නිසා ආදායම් සංකේතාංක 13 කට අදාලව ඇස්තමේන්තු ආදායමට ළඟා නොවීම රු.8,987,072 සිට රු.11,358,846 ක් දක්වා එනම් සියයට 13 සිට සියයට 95 අතර පරාසයක වූ අතර, ආදායම් සංකේතාංක 12 කට අදාලව ඇස්තමේන්තු ගත ආදායම ඉක්මවූ තථ්‍ය ආදායම රු.182,456,925 සිට රු.1,073,281 ක් දක්වා එනම්, සියයට 09 සිට සියයට 54 අතර පරාසයකින් වැඩි වී තිබුණි.

(ආ) හිඟ ආදායම් පිළිබඳව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ දෙකක විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | වර්ෂය | | |
|---|---|---|---|
| | 2016 | 2015 | 2014 |
| | රු. | රු. | රු. |
| දේපල පැවරීම මත අතිරේක මුද්දර බදු | 32,290,394 | 5,012,980 | 7,195,967 |
| ව්‍යාපාරික පිරිවැටුම් බදු | 93,946,012 | - | - |
| ඉඩම් සහ අනෙකුත් බදු කුලී | 11,556,809 | 6,372,026 | 3,932,922 |
| ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධ ගාස්තු | 560 | 127,190 | 402 |

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පිළිවෙලින් රු. 391,931,086 ක් සහ රු. 94,066,762 ක් අදාල පළාත් පාලන ආයතනවලට ලබාදීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) 2011 වර්ෂය දක්වා අයකරගත යුතු රු.243,392,455 ක් වූ හිඟ පිරිවැටුම් බදු ප්‍රමාණය 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයකර ගැනීම සියයට 11.43 සිට 0.37 දක්වා පරාසයක් තුල ඉතාමත් අවම මට්ටමක පැවතුන අතර, තවදුරටත් රු. 93,946,012 ක් අයවීමට තිබුණි.

(ඉ) වයඹ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ 2004 මැයි 27 දිනැති අංක වප්‍රලේ/5/3/13/7-2 දරන පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කරන ලද ලිපියට අනුව අයකර ගත නොහැකි බදු මුදල් කපා හැරීමේ බලය රු.100,000 ක් වූ සීමාව පදනම් කරගෙන අයකර ගතයුතු පිරිවැටුම් බදු 2015 වර්ෂයේදී රු.32,366,302 ක් හා 2016 වර්ෂයේදී රු.75,142,594 ක් පළාත් ආදායම් කොමසාරිස් විසින් නිදහස් කර තිබුණි. තවද, ඉහත

ලිපියේ 03 ඡේදය අනුව කපා හරින ලද බදු පිළිබඳ මාසික වාර්තා ප්‍රධාන ලේකම්වරයාට යවා නොතිබුණි. හිඟ පිරිවැටුම් බදු කපාහැරීමට අදාල විස්තර විගණනයටද ඉදිරිපත් නොකරන ලදී.

(ඊ) 2015 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මෝටර් වාහන බලපත්‍ර ආදායම ඉකුත් වර්ෂයේ ගිණුම අනුව රු.7,616,648 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු.4,845,009 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 04. මූල්‍ය සමාලෝචනය

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ රු. 216,897,422 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,400,467,030 ක් විය.

### 4.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 4.2.1 ආදායම් හා වියදම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2016 | | | 2015 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ආදායම් | | | | | | |
| බදු ආදායම් | 6,653.00 | 6,555.69 | 97.31 | 5,450.00 | 5,658.70 | (208.70) |
| බදු නොවන ආදායම් | 863.00 | 826.84 | 36.16 | 725.00 | 724.03 | 0.97 |
| රජයේ ප්‍රදාන | 35,345.88 | 25,700.77 | 9,645.11 | 24,927.33 | 24,417.02 | 510.31 |
| වෙනත් ලැබීම් | 195.03 | 135.72 | 59.31 | - | - | - |
| එකතුව | 43,056.91 | 33,219.02 | 9,837.89 | 31,102.33 | 30,799.75 | 302.58 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,285.91 | 23,225.71 | 60.20 | 22,213.90 | 21,859.94 | 353.96 |
| අනෙකුත් | 6,073.60 | 4,998.35 | 1,075.25 | 5,486.51 | 4,828.78 | 657.73 |
| උප එකතුව | 29,359.51 | 28,224.06 | 1,135.45 | 27,700.41 | 26,688.72 | 1,011.69 |
| ප්‍රාග්ධන වියදම් | 13,697.40 | 4,778.06 | 8,919.34 | 3,401.92 | 2,710.56 | 691.36 |
| එකතුව | 43,056.91 | 33,002.12 | 10,054.79 | 31,102.33 | 29,399.28 | 1,703.05 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය අතර අනුපාතය 6:1 ක් විය.

05. ප්‍රඥප්ති ගිණුම්/ අරමුදල් ගිණුම්/ වාණිජ අත්තිකාරම් ගිණුම් හා අනෙකුත් අත්තිකාරම් ගිණුම්
-----------------------------------------------------------------------------------------------------

5.1 **අධිකාරි ගිණුම්/ අරමුදල් ගිණුම්**
**---------------------------------**

(අ) විගණන මතය
---------------
වයඹ පළාත් සභාවේ ස්ථාපිත අධිකාරි 09 ක් සහ අරමුදල් 05 ක් සඳහා තත්ත්වාගණනය කල විගණන මතයන් ඉදිරිපත් කෙරුණි.

(ආ) විගණන නිරීක්ෂණ
----------------------

(i). මානව සම්පත් සංවර්ධන අධිකාරිය
------------------------------------
කුරුණෑගල ශික්ෂණ රෝහලට පවිත්‍රතා සේවය ලබාදීම සඳහා වූ ගිවිසුමට රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය වෙනස්කම් ඇතුළත් නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයට අදාල රු.7,369,426 ක්වූ හිඟ මුදල කුරුණෑගල ශික්ෂණ රෝහලෙන් අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ii). වයඹ සංවර්ධන අධිකාරිය
----------------------------

- රුපියල් මිලියන 53.3 ක් වැය කර ඉදිකර තිබූ මදුරන්කුලිය සංචාරක තොරතුරු හා පහසුකම් මධ්‍යස්ථානය 2014 වර්ෂයේ පළමු පියවරේ වැඩ අවසන් කළ දින සිට ආදායම් උත්පාදනය කර ගැනීමට භාවිතා කළ හැකිව තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

- වයඹ සංචාරක හෝටල් පාසැලෙහි මෙහෙයුම් කටයුතු සිදුකිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට 2014 නොවැම්බර් 20 දින එළඹ තිබුණද, එහි දේපළ වෙනුවෙන් බදු කුලියක් ලබා ගැනීමට එකඟතාවයක් ඇති කරගෙන නොතිබීම හේතුවෙන් අධිකාරිය සතු රු.මිලියන 112 ක වත්කම් වලින් කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

- 2014 නොවැම්බර් 01 දින ගිවිසුමක් මත බදු දී තිබූ බඩගමුව සංචාරක මධ්‍යස්ථානයේ අංක 03 හා 04 දරන කඩකාමරවල බදු ගිවිසුමට අදාළ කොන්දේසි කඩකිරීම හේතුවෙන් අධිකාරිය විසින් 2015 මැයි 14 දින බදු ගිවිසුම අවලංගු කර තිබුණි. ඒ හේතුවෙන් බදුකරු අධිකාරියට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණු අතර, 2016

වර්ෂය අවසාන වන විටද අදාළ ගැටලු සහගත තත්ත්වය නිරවුල් වී නොතිබීම හේතුවෙන් අධිකාරියට රු.1,047,385 ක බදු ආදායමක් අහිමිවී තිබුණි.

(iii). වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

-----------------------------------

- 2016 සහ ඊට පෙර වර්ෂ 07 කට අදාළ එකතුව රු. 19,555,610 ක් වූ නිශ්චිත ගාස්තු මත අයකල බදු 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ නියමයන් අනුව දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

- සමාලෝචිත වර්ෂය සහ පෙර වර්ෂ තුනකට අදාල එකතුව රු. 6,186,957 ක් වූ සේවක අර්ථ සාධක සහ සේවක භාරකාර අරමුදල් දායකයන් ප්‍රේෂණය කර නොතිබුණු බැවින් රු. 5,23,937 ක අධිභාර හා දඩ මුදල් ගෙවීමට සිදුව තිබුණි.

- යන්ත්‍රෝපකරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය දුර්වල වීම හේතුවෙන් බැංකු අයිරා ලබාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ බැංකු අයිරා පොළිය ලෙස රු.953,423 ක් ගෙවීමට සිදුව තිබුණි.

(iv). වයඹ ජනකලා පදනම

------------------------

ජනකලා පදනමේ කුරුණෑගල සහ හලාවත විස්කම් නිවාසවල 2016 වර්ෂයේ මුළු අලාභය රු.1,799,033 වුවත්, පදනමෙහි කළමනාකාරිත්වය එම තත්ත්වය වෙනස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(v). වයඹ පළාත් පරිසර අධිකාරිය

-------------------------------

- පරිසර බලපත්‍ර ලබා නොගන්නා කර්මාන්ත සම්බන්ධයෙන් සහ පරිසර හානිය අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පරිසර ප්‍රඥප්තිය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

- රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 චක්‍රලේඛය ප්‍රකාරව එක් වරකට ගෙවිය හැකි රු. 250,000 ක් වූ ආපදා ණය මුදල ඉක්මවා එක් වරකට රු. 500,000 ක් බැගින් නිලධාරීන් 13 දෙනෙකුට ආපදා ණය ගෙවා තිබුණු අතර,

ඒ සඳහා අනුමැතියකින් තොරව රු. 3,500,000 ක් වූ ස්ථාවර තැන්පත්ද මුදල් කරගෙන තිබුණි. තවද එම නිලධාරීන් 11දෙනෙකුගේ එකතුව රු. 998,980 ක් වූ පැරණි ආපදා ණය ශේෂය හිලව් කර ගෙන නොතිබුණි.

(vi). කර්මාන්ත සේවා කාර්යාංශය

------------------------------

කර්මාන්ත සේවා කාර්යාංශය විසින් බාහිර පාර්ශවයන්ට සපයා තිබෙන සේවා වෙනුවෙන් වසර 03 කට ආසන්න කාලයක් තුල හිඟව පවතින රු. 547,098 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vii). ප්‍රධාන අමාත්‍ය අරමුදල

--------------------------

ප්‍රධාන අමාත්‍ය අරමුදලින් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රීඩා සහ අධ්‍යාපන ආධාර වෙනුවෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි.

(viii). වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය

---------------------------------------------

මත්ස්‍ය අභිජනන සහ මත්ස්‍ය සැකසුම් ව්‍යාපෘති වසර 04 ක කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු. 4,140,000 ක්වූ මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා රු. 4,925,000 ක් වූ විසිතුරු මත්ස්‍ය තටාකාංගනය නිශ්ක්‍රීය තත්ත්වයට පත්ව තිබුණි.

(ix). වයඹ සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

---------------------------------------------------------

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ කටයුතු පරිගණකගත කිරීම සඳහා 2010 වර්ෂයේදී වයඹ පුහුණු ආයතනය සමඟ ගිවිසුම් ගතව රු.168,000 ක අත්තිකාරම් ගෙවා තිබුණද, 2016 වර්ෂය අවසාන වන විටද අදාල කාර්යය ඉටු වී නොතිබුණි. තවද, මෙම අරමුදලේ කටයුතු පරිගණකගත කිරීමේ කාර්යය සඳහා 2016 වර්ෂයේදී නැවත වරක් රු.600,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, 2017 මැයි මාසය වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

(x) වයඹ ක්‍රීඩා අරමුදල
--------------------

- වයඹ පළාත් සභාවේ 1992 අංක 04 දරන ක්‍රීඩා ප්‍රඥප්තියේ 35 වගන්තිය ප්‍රකාරව ශිල්පායතනයට සිසුන් ඇතුලත් කර ගැනීම, අධ්‍යාපනය, පුහුණුව හා විභාග පැවැත්වීම යනාදී කරුණු සම්බන්ධයෙන් පටිපාටි සකස් කර නොතිබුණි.

- ප්‍රමාණවත් පරිදි කායවර්ධන උපකරණ හා පහසුකම් නොමැතිවීම සහ කායවර්ධන පුහුණුකරුවෙකු නොමැතිවීම හේතුවෙන් කායවර්ධන අංශයේ සමාලෝචිත වර්ෂයේ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 82 කින් පහල ගොස් තිබුණි.

5.2 වාණිජ අත්තිකාරම් ගිණුම්
----------------------------

(අ) පේෂකර්ම දෙපාර්තමේන්තුවේ අමුද්‍රව්‍ය සැපයීම ඇතුළුව පේෂකර්මාන්ත වැඩපළවල් පිහිටුවීම හා පරිපාලනය සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට රු. 18,573,677 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් අවුරුදු 10 සහ අවුරුදු 02 ඉක්ම වූ ණය ශේෂයන් පිළිවෙලින් රු.1,598,588 සහ රු.7,488,735 ක් අයකර ගැනීමට පාලන අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ආ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් කාර්මික පාසැල්වල පුහුණුව සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව වාර්ෂිකව අඩුවීම හේතුවෙන් රු.6,338,600 ක් වූ යන්ත්‍ර හා උපකරණ නිශ්ක්‍රීයව පැවති කාලය වාර්ෂිකව වැඩි වෙමින් පැවතිණි.

(ඇ) වයඹ පුහුණු ආයතනයේ අත්තිකාරම් ගිණුමේ රු.16,000,000 ක් වූ වියදමේ උපරිම සීමාව රු. 302,272 කින් ඉක්මවා තිබුණි.

(ඈ) 2016 නොවැම්බර් 04 දිනැති අංක 2016/20 දරන එකතු කල අගය මත බදු සංශෝධන පනතේ 10 වගන්තිය ප්‍රකාරව එකතු කල අගය මත බදු බැඳියාවට ලියාපදිංචි වීමට වයඹ පුහුණු ආයතනය කටයුතු කර නොතිබුණි.

06. මෙහෙයුම් සමාලෝචනය

6.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) හලාවත අධ්‍යාපන කලාපයේ 2013 වර්ෂයේ සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය අසමත් වීමේ ප්‍රතිශතය සියයට 39 සිට සියයට 47 දක්වා ඉහළ ගොස් තිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් බරවා රෝග මර්ධන ඒකකය විසින් 2015 වර්ෂය තුලදී කුරුණෑගල දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 49,072 කගේ බරවා රෝග රුධිර පටල පරීක්ෂා කර තිබූ අතර එය දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයට සාපේක්ෂව සියයට 2.9 ක් පමණක් වූයෙන් පරීක්ෂණ කටයුතු ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි.

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2015 වර්ෂයේ ඩෙංගු රෝගීන් 1,378 ක් හා 2016 දී ඩෙංගු රෝගීන් 2,563 ක් ලෙස 2015 ට සාපේක්ෂව 2016 දී සියයට 46 කින් එම රෝගීන් සංඛ්‍යාව වැඩි වී තිබියදී, ඩෙංගු මර්දන වැඩසටහන් සඳහා 2016 දී ලැබී තිබුණු රු. 6,613,500 කින් රු. 892,720 ක් ඉතිරි වී තිබුණි.

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ 10 ක් සඳහා ජලභීතිකා එන්නත ලබාදීමට සැලසුම්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල එය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඉ) වකුගඩු රෝගය බහුලව පවතින අඹන්පොල, කොබෙයිගනේ, පොල්පිතිගම, ගල්ගමුව, ගිරිබාව, නිකවැරටිය සහ මහව ප්‍රදේශවල වකුගඩු රෝගීන් හඳුනාගැනීම හා රෝගීන් පරීක්ෂා කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට රු.5,000,000 ක් වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණේ රු.1,583,770 ක් පමණි.

(ඊ) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ අලෙවි මධ්‍යස්ථාන 102 කින් 2014 වර්ෂයේදී අපේක්ෂිත අලෙවි වටිනාකම රුපියල් මිලියන 103 ක් වුවද වර්ෂයේ සත්‍ය අලෙවි වටිනාකම රුපියල් මිලියන 39.5 වී තිබුණු අතර, එම වටිනාකමෙන් සියයට 75 ක් මධ්‍යස්ථාන 8 කින් පමණක් සිදු කර තිබුණි.

(උ) ඉකුත් වර්ෂයන්ට අදාලව ලැබී තිබුණු මූලික විනය පරීක්ෂණ ලිපිගොනු 31 ක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් සිදුකර විනය නියෝග ලබා දීමට 2017 අප්‍රේල් 18 දිනටද වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට නොහැකි වී තිබුණි.

(ඌ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව "අපයෝජනයෙන් තොරව ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම" සඳහා විවිධ සමාජ කොටස් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් බල ප්‍රදේශ 9 ක් ආවරණය වන පරිදි පැවැත්වීමට පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර තිබුණද, ප්‍රදේශ 05 ක පමණක් පවත්වා තිබුණු වැඩසටහන් වලින් වැඩි වශයෙන් ඉලක්ක කර තිබුණේ පාසල් ළමුන් පමණි.

6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් පරිවාසගත ළමුන් සම්බන්ධයෙන් තොරතුරු නිසි පරිදි යාවත්කාලීනව පවත්වා ගෙන නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පරිවාස ගත කරන ලද ළමුන් සමාජ ගත කිරීම අපේක්ෂිත මට්ටමකට ලඟා වී තිබුනේද යන්න විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(ආ) පළාත් සභා පරිශ්‍රය තුළ ලංකා බැංකු ශාඛාවක් ස්ථාපිත කර ඇතත්, ඒ සඳහා කිසිදු බදු කුලියක් මෙන්ම ජලය හා විදුලිය වෙනුවෙන් ගාස්තුවක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද බැංකු කළමනාකාරිත්වය සහ පළාත් සභාව අතර වූ ගිවිස්නාව විගණනය සඳහා ඉදිරිපත් නොකරන ලදී.

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේ කාර්යය නිසි ලෙස සැලසුම් කර නොමැතිවීමෙන් 2016 වර්ෂයේ ඇණවුම් කරන ලද එකතු වටිනාකම රු.188,228,458 ක් වූ වෛද්‍ය උපකරණ 2017 පෙබරවාරි 16 දින වන විටත් දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි.

(ඈ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ කොහු කර්මාන්ත මධ්‍යස්ථාන 16 න් වර්ෂය තුල රු.100,000 ක ආදායමක් අපේක්ෂා කර තිබුණද වර්ෂය තුල ඒ සඳහා කිසිදු ඇණවුමක් ලබා ගෙන නොතිබුණි.

(ඉ) පරිවාස කාර්යාල 05 කට අයත් ළමා නිවාස 14 ක වයස අවුරුදු 18 ඉක්ම වූ ළමුන් 58 දෙනෙකු සමාජ ගත කිරීමට වැඩ පිළිවෙලක් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සකස් කර නොතිබුණි.

(ඊ) වයඹ පළාත තුල පවත්නා ළමා නිවාස වලින් 09 ක රඳවා ගැනීමට අනුමත ප්‍රමාණය ඉක්මවා ළමුන් 01 සිට 20 දක්වා රඳවා ගෙන තිබීම ළමා සුභසාධන සහ රැකවරන කටයුතුවලට අහිතකර තත්ත්වයක් විය.

(උ) සමාජ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබූ විශේෂ වෛද්‍යාධාර අයදුම්පත් වෙනුවෙන් එම ආධාර ලබාදීමට වර්ෂ 1 ½ සිට වර්ෂ 03 දක්වා කාල ප්‍රමාදයක් සිදුව තිබුණි.

(ඌ) වයඹ පළාතේ පිහිටි ද්විතියික පාසල්වල තාක්ෂණ විද්‍යාගාර 126 ක් ස්ථාපිත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට පාසල් 36 ක පමණක් උසස් පෙළ විද්‍යා /ගණිත පංති ආරම්භ කර තිබුණි. එම පාසල් 20 කින් 2015 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයට විද්‍යා/ ගණිත අංශයෙන් සිසුන් 127 ක් පෙනී සිට තිබූ නමුත්, ඉන් සිසුන් 11 දෙනෙක් පමණක් සමත් වී තිබුණි.

(එ) රෝගී සත්කාරක සේවා සඳහා ප්‍රමාණවත් පරිදි ඖෂධ නිෂ්පාදනය නොකිරීම හේතුවෙන් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුල රු.6,694,875 ක් වටිනා ඖෂධ වර්ග 14 ක් ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් මිලදී ගෙන තිබුණි.

(ඒ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.1,826,250 ක් වූ වේරහැර ප්‍රාදේශීය සමූපකාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව කටුගම්පොල විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ලබාදී තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල කුරුණෑගල, කුලියාපිටිය, මහව හා හලාවත සමූපකාර උපකොමසාරිස් කාර්යාලවලට අදාලව විවිධ අධිකරණවලින් ලැබී තිබුණු එකතුව රු. 68,355,626 ක් වූ තැන්පත් සහ උසාවි දඩ මුදල් අදාල සමිතිවලට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවට විද්‍යුත් නූල් ඔතන යන්ත්‍ර 38 ක් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවකු වෙත රු.399,000 ක් 2016 අවසාන මාස දෙකේදී ගෙවා තිබුණද, 2017 මැයි 09 දිනටත් යන්ත්‍ර 17 ක් සපයා නොතිබුණි.

(ක) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී දින රහිතව ඇනවුම් කරන ලද 1" ගිනි සපු ලෑලි හතරැස් අඩි 1500 න් සමාලෝචිත වර්ෂය අවසානයට සපයා තිබූ ප්‍රමාණය හතරැස් අඩි 514 ක් වුවද, මුළු දැව තොගයම ලද බවට දැව තොග පොතට සටහන් කර 2016 දෙසැම්බර් 29 දින රු.165,500 ක් වූ මුළු මුදලම ගෙවා තිබුණි.

(ග) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ එකතුවන කැලි කසළ කළමනාකරණය සඳහා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම්වරයා විසින් යෝග්‍ය ඉඩමක් ලබා නොදීම හේතුවෙන් රු.1,776,350.66 ක ප්‍රතිපාදන ප්‍රාදේශීය සභාව විසින් ආපසු යවා තිබුණි.

(ජ) මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉරට්ටකුලම උතුර ග්‍රාම නිලධාරී වසමේ රජයට අයත් අක්කර 171 ක් වූ ඉඩමක් දීර්ඝ කාලීන බදු දීමේ කටයුතු 2015 වර්ෂයේ සිට ප්‍රමාද වී තිබුණි.

(ච) පුද්ගලික සමාගමකට දිගුකාලීනව බදු දී තිබෙන ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අක්කර 01 රූඩ් 02 පර්චස් 35 ක ඉඩම සඳහා වසර 10 කට වැඩි කාලයක සිට අයවිය යුතු රු.12,408,750 ක බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ට) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක රජයේ ඉඩම් බදු දීම මත සමාලෝචිත වර්ෂයේ වාර්ෂික හිඟ බදු රු. 457,664 ක් හා දිගු කාලීන හිඟ බදු රු. 1,222,757 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඩ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබූ රියදුරෙකු සාවද්‍ය අධ්‍යාපන සහතික ඉදිරිපත් කර තිබෙන බවට 2013 පෙබරවාරි මාසයේදී විභාග කොමසාරිස් විසින් දැනුම්දී තිබියදී ඔහුගේ සේවය අත්හිටුවීම 2015 ජූනි දක්වා ප්‍රමාද කර තිබුණු අතර, එම කාලයට අදාලව රු.693,490 ක නීත්‍යානුකූල නොවූ වැටුපක් ගෙවා තිබුණි.

(ණ) නාත්තන්ඩිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය විසින් ඇප ලබා ගන්නා අවස්ථාවේ ආයතනයන් වෙත නිකුත් කල කුවිතාන්සි පත් ආපසු ලබා නොගෙන රු.158,354 ක් වටිනා ඇප දෙකක් නිදහස් කර තිබුණි.

(ත) ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ බැංකු ගිණුමේ 2010/2011 වර්ෂවල සිදුවූ මූල්‍ය වංචාව තුලින් ඇතිවී තිබුණු රු. 13,609,655 ක්වූ බැංකු අයිරාව පියවීම සඳහා පළාත් භාණ්ඩාගාර තැන්පතු ගිණුමෙන් ලබාදී තිබුණු අත්තිකාරම් මුදල වගකිව යුතු

ආයතන/ පුද්ගලයින්ගෙන් ආපසු අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙන නොතිබුණි. මෙම වංචාවට මහජන බැංකුව නීත්‍යානුකූලව වගකිව යුතු බවට තීරණය වුවහොත් එම අලාභය ගෙවීමට 2011 ජූනි 30 දිනැති ලිපියක් මගින් මහජන බැංකුව එකඟ වී තිබුණි.

6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථයක් අලුත්වැඩියා කිරීමට අදාල 2015 ජුනි 04 දිනැති රු.152,000 ක් වූ මිල ගණන් සඳහා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට මාස 06 ක කාලයක් ගතවී තිබීම නිසා ඉහත සඳහන් මිලට අලුත්වැඩියාව සිදු කිරීම ගරාජය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එබැවින් රු. 235,000 ක් වූ දෙවන අවම මිල ගණන් ඉදිරිපත් කළ ආයතනයට භාරදී තිබුණු අතර, අලුත්වැඩියාව 2017 ජනවාරි වන විටද නිම වී නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථයක් රු.18,500 ක්වූ මුදලකට අළුත්වැඩියා කිරීමට 2013 ඔක්තෝබර් 10 දින ගරාජයකට භාරදී තිබුණි. වසර 2 ½ කට පසුව ගරාජය විසින් ඉදිරිපත් කර තිබුණු රු.429,500 ක වෙනත් ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීම සඳහා කටයුතු කර තිබුණි.

(ඇ) පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථයක අලුත්වැඩියාවක් රු. 21,500 ක ඇස්තමේන්තුවක් මත 2013 ඔක්තෝම්බර් මාසයේදී ගරාජයකට භාරදී තිබුණි. වසර දෙක හමාරකට පසුව ගරාජය ඉදිරිපත් කල රු. 202,800 ක ඇස්තමේන්තුවක් අනුමත කර ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර තිබුණි.

(ඈ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සවස කිරි එකතු කිරීම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රු.10,237,830 ක් වැයකර අධි ශීතකරණ 56 ක් හා මිනිකූලර් 15 ක් මිලදීගෙන කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානවලට ලබාදී තිබුණි. මෙම උපකරණ සම්බන්ධ භෞතික පරීක්ෂාවේදී විවිධ හේතූන් මත කිරි සමිති 5 ක් විසින් එම ශීතකරණ භාවිතයට ගෙන නොතිබූ අතර සවස එකතු වන කිරි

භාවිතා කරමින් නැවුම් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීමේ අරමුණද ක්‍රියාත්මකව නොතිබුණි.

(ඉ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් වාරියපොල පශු වෛද්‍ය කොට්ඨාශයේ කිරි පට්ටි සංවර්ධන පදනම වෙත 2015 මැයි මාසයේදී ලබාදී තිබුණු රු. 701,905 ක් වූ මිනි ලැබ් එකක් හා මිනි කූලර් එකක් 2017 ජූලි මාසය වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

(ඊ) පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂයේදී රු.447,040 කට මිලදී ගෙන බෙදාහැර තිබූ උපකරණ වලින් ප්‍රතිලාභීන් 05 දෙනෙකු වෙත ලබාදී තිබුණු තර්මෝස්ටැට්, කිරි උණු කිරීමේ ද්විත්ව භාජන, ගෑස් ලිප්, ක්‍රීම් සෙපරේටර්, බෝතල් සීල්කරණ සහ ප්‍රෙෂර් කුකර් යනාදී උපකරණ විවිධ හේතූන් මත භාවිතා කර නොතිබුණි.

(උ) රජයේ ඉඩම් කළමනාකරණය කිරීමේ E – Slim වැඩසටහන යටතේ 2016 වර්ෂය අවසන් වන විට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉඩම් කට්ටි 120,000 ක සහ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් කට්ටි 50,000 ක දත්ත ඇතුලත් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් රු. 1,994,850 කට ටැබ් 16 ක් සහ ලැප්ටොප් පරිගණක 15 ක් මිලදී ගෙන ජනපද නිලධාරීන්ට ලබා දී තිබුණි. එහෙත් වර්ෂය අවසන් වන විට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉඩම් කට්ටි 13,563 ක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් කට්ටි 19,268 ක් පමණක් පරීක්ෂා කර දත්ත ඇතුලත් කර තිබුණි.

(ඌ) මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය විසින් අඩි 140 x 35 ප්‍රමාණයේ ග්‍රාම සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2007 වර්ෂයේදී රු.900,000 ක් වැයකර අටමුණේ විද්‍යාල භූමියේ අත්තිවාරමක් දමා තිබුණු අතර, පසුව අදාල කාර්යය අත්හැර දමා තිබුණි.

(එ) පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂයේදී පෙරමෝන උගුල් 20,300 ක්, ප්‍රතිරෝධී දැල් මීටර් 6,250 ක්, පැපොල් නෙලන උපකරණ 120 ක්, ඉණිමං 20 ක්, කලු පොලිතීන් බඳුන් 755,300 ක්, පොලිතීන් කැබලි 700 ක් සහ ඇසුරුම් 20,000 ක් රු.13,349,175 කට මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර නොතිබුණි.

(ඒ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රජයේ ඉඩම් 2013 සිට 2015 දක්වා අනවසරයෙන් අල්ලා ගැනීම් නියමානුකූල කිරීම හා දිර්ඝ කාලීන බදු අනුමැතිය සඳහා ලිපි ගොනු 15 ක් පළාත් ඉඩම් කොමසාරිස් වෙත යවා තිබුණු නමුත් 2016 වර්ෂය අවසානය වන විටද අනුමැතිය ලැබී නොතිබුණි.

(ඔ) රිදීගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඉඩමක් දීර්ඝකාලීන බදු පදනම මත මොබිටෙල් (පුද්ගලික) සමාගමට හා මහජන බැංකුවට ලබාදී තිබුණු අතර, බදු ගිවිසුම් ප්‍රකාරව වර්ෂ 05 කට වරක් බදු මුදල් සංශෝධනය කර අයකර නොගැනීම හේතුවෙන් රු.648,000 ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ඕ) පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් රජයේ ඉඩම් දීර්ඝ කාලීනව බදුදීමේදී 2003 සිට 2016 දක්වා වාර්ෂිකව අයවිය යුතු බදු මුදල් රු.1,456,400 ක් පළාත් සභාවට ලැබිය යුතුව පැවති අතර, එම ශේෂය තුළ ජාතික ජල සම්පාදන මණ්ඩලයෙන් 2004 සිට 2006 දක්වා ලැබිය යුතු රු.172,800 ක මුදලක්ද ඇතුළත්ව තිබුණි.

(ක) වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුව මගින් රු. 55,056,581 ක ප්‍රතිපාදන මත ඉදිකිරීම් සිදුකරන ලද කර්මාන්ත 10 ක රු. 40,669,635 ක වැඩ ඉටුකර තිබූ අතර, ඇස්තමේන්තු කර තිබූ වැඩ විෂයයන් පසුව සංශෝධනය කිරීම නිසා රු. 3,350,812 ක්වූ අමතර වැඩ සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

(ග) වාරියපොල ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් වැල්ලැගල මහා විද්‍යාලයීය අත්පන්දු ක්‍රීඩාංගනය ඉදිකිරීමේදී ක්‍රීඩාපිටිය සඳහා නාම පුවරුවක් සවි කිරීම සහ ෆ්ලැෂ් ලයිට් සවි කිරීම සඳහා වූ රු. 410,000 ක වැඩ විෂයයන් ඉටුකිරීම වෙනුවට අමතර කාර්යයන් සිදුකර තිබුණි.

(ච) වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය තුළ ගෘහ නිර්මාණ ශිල්පීන් 03 දෙනෙකු හා සිවිල් ඉංජිනේරුවරුන් 17 දෙනෙකු සේවයේ යොදවා තිබියදී බාහිර පාර්ශවයන්ගෙන් ලබාගත් ගෘහ නිර්මාණ සැලසුම් හා උපදේශන සේවා සඳහා ගාස්තු ලෙස 2014, 2015 හා 2016 වර්ෂ වලදී එකතුව රු.2,788,488 ක් ගෙවා තිබුණි.

(ජ) කුරුණෑගල කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පාසල් 15 ක ශිෂ්‍යත්වලාභීන් 176 ක් වෙනුවෙන් 2014 සහ 2015 වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු. 210,500 ක ශිෂ්‍යාධාර මුදල් ගෙවා නොතිබුණි.

(ට) 2014 වර්ෂයේ දත්ත අනුව වයඹ පළාතේ වකුගඩු රෝගීන් බහුලව සිටින ග්‍රාම නිලධාරි වසම් 183 ක් තිබුණද, ඉන් වසම් 79 ක පමණක් 2016 වසරේදී රු. 218,000,000 ක් වැය කර ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු ඒකක ස්ථාපිත කර තිබුණි

(ඩ) වගකීම් කාල සීමාව තුල සම්පූර්ණයෙන්ම අක්‍රියවී තිබුණු රු.3,400,000 ක්වූ ගිරිබාව ඉහල මරදංකඩවල ප්‍රතිආශ්‍රිත ජල පිරිපහදු පද්ධතිය වෙනුවට නව පිරිපහදු පද්ධතියක් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

6.4 පළාත් මාර්ග සංවර්ධනය හා වැඩිදියුණු කිරීම

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ කුලියාපිටිය විධායක ඉංජිනේරු කාර්යාලය විසින් තුංතොට පඩිවෙල මාර්ගය කි.මී.10.8 ක නඩත්තු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂයේ ජූනි 30 දින වන විට අවස්ථා 05 කදී රු.6,376,248 ක් වැය කර තිබුණද, අදාල නඩත්තු කටයුතු ප්‍රමිතියකට සිදුවී නොතිබුණු බව 2016 ජූලි මස භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හංහමුණ දම්පිටිය මාර්ගයේ කි.මී.1.57 ක් 2016 මාර්තු මාසයේදී රු.1,006,443 ක් වැය කර නඩත්තු කටයුතු සිදුකර තිබියදී එම දුර ප්‍රමාණයම ආවරණය වන පරිදි කි.මී.1.39 ක් වැඩි දියුණු කිරීම් වශයෙන් 2016 ජූනි සහ ජූලි මාසවලදී රු.1,999,785 ක් ගෙවා තිබුණි.

(ඇ) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2016 නොවැම්බර් මාසය වන විට රු. 1,585,096 ක් වැය කර සංවර්ධනය කරන ලද තඹරවිල වයික්කාල මාර්ගය නැවත 2016 දෙසැම්බර් මාසයේදී කාපට් ඇතිරීම නිසා ඉහත මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඈ) පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තබ්බෝව පිළාකටුමුල්ල මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා රු.986,619 ක්වූ ඇස්තමේන්තුව මත වැඩිහිටි පුද්ගල සමාජයක් සමඟ ගිවිසුම්ගතව වැඩ ආරම්භ කිරීමෙන් අනතුරුව හේතු දැක්වීමකින් තොරව කාර්යය අත්හැර දමා තිබුණි.

6.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-------------------------------

ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෙක්ටයාර් 30.704 විශාල ඉඩම 1999 වර්ෂයේදී වාර්ෂිකව රු. 304,000 ක බදු මුදලකට වසර 30 කාලයක් සඳහා සී/ස (ජනතා) හිරියාල ගොවි සමාගම වෙත ලබාදී තිබුණු අතර එම සමාගම අදාල ඉඩම පෞද්ගලික

බැංකුවක ඇපයට තබා ණය මුදලක් ලබාගෙන තිබුණි. ගොවි සමාගම අකර්මන්‍ය වීම හේතුවෙන් උක්ත ඉඩම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බැංකුව කටයුතු කර තිබුණි.

## 6.6 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

පළාත් සභාවේ විවිධ ආයතනවල පහත සඳහන් පරිදි වූ නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම් පැවති අතර, ඒවා සුදුසු පරිදි ප්‍රයෝජනයකට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

| | කාර්යාලය | වත්කම් වර්ගය | වටිනාකම | අභාවිතව පැවති කාලය |
|---|---|---|---|---|
| | | | රු. | වර්ෂ |
| (අ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව කුලියාපිටිය මූලික රෝහල | Micro Hematocrit - 02<br>Cenrifuge -01<br>Mini Autoclave – 01<br>Hematocrit - 02 | - | 01 |
| | | Incubator | | 03 |
| (ආ) | හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ක්‍රීඩා උපකරණ | 220,396 | 02 |
| (ඇ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මල්ලවපිටිය සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය | Stethescope – 14<br>Hot Plate – 02<br>ශල්‍ය උපකරණ - 67<br>ග්ලූකෝමීටර් - 03<br>IV,Canula -20 | - | 01 – 03 දක්වා |
| (ඈ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - නාරම්මල රෝහල | වෛද්‍ය නිල නිවාස - 03<br>කාමර 14 පොදු නිල නිවස | - | 02 ට වැඩි |
| (ඉ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - අඹන්පොල රෝහල | උපකරණ සහිත ළමා වාට්ටුව | - | 08 |
| (ඊ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - අලව්ව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය | ශෛල්‍ය වෛද්‍ය උපකරණ වර්ග 14 ක ඒකක 174 | - | 01 – 04 දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | පොල්පිතිගම රජයේ සංස්කෘතික මධ්‍යස්ථානය | ගොඩනැගිලි | 9,024,858 | 01 |
| (ඌ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - මඩහපොල වෛද්‍ය සත්කාර ඒකකය | ගොඩනැගිලි | 1,060,760 | 01 |
| (එ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහව අධ්‍යාපන කලාපය | පාලුකඩවල ගුරු නේවාසික මධ්‍යස්ථානය | 16,815,000 | 04 |
| (ඒ) | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | ලිය ඉඳුවර වක්‍රීය ණය වැඩසටහනේ බැංකු ගිණුම් - 02 | 4,683,947 | 02 |
| (ඔ) | පළාත් පේෂකර්ම දෙපාර්තමේන්තුව | නූල් වර්ණ ගැන්වීමේ යන්ත්‍රය | 2,783,200 | 04 |
| (ඕ) | පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - කුලියාපිටිය රෝහල | අළුත්වැඩියා කරන ලද නේවාසික රෝගී වාට්ටුවක් | 2,139,831 | 01 |

6.7 ආර්ථික නොවූ ගණුදෙනු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.2,300,000 ක් වැයකර කුලියාපිටියේ ඉදිකර තිබෙන කාබනික නිෂ්පාදන අලෙවිසැල අපේක්ෂිත අරමුණු කෙරෙහි යොදවා නොතිබුණි.

(ආ) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී රු.248,645 කට මිලදී ගෙන තිබූ විදුලි සකපෝරු 03 ක් මැටි පුහුණු මධ්‍යස්ථාන වල විදුලි පරිපථවල ධාරිතාව ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2017 මැයි 31 දින වන විටත් උපයෝගී කර ගෙන නොතිබුණි.

(ඇ) පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් 2014 වර්ෂයේදී රු.1,764,000 කට මිලදීගෙන තිබූ කිලෝ ග්‍රෑම් 60 ක ධාරිතාවයෙන් යුත් නූල් වියලීමේ යන්ත්‍රයෙන්

වරකට වියලිය හැකි නූල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 12.5ක් වූ බැවින් දිනකට වියළිය හැක්කේ කිලෝ ග්‍රෑම් 25 ක් පමණක් බව තහවුරු විය.

(ඇ) පේෂකර්ම දෙපාර්තමේන්තුව 2011 වර්ෂයේදී රු.2,783,200 ක් වැයකර නූල් වර්ණ ගැන්වීමේ යන්ත්‍රයක් මිලදී ගෙන තිබියදී සමාලෝචිත වර්ෂයේදී නූල් කිලෝ 4,904 ක් වර්ණ ගැන්වීම වෙනුවෙන් බාහිර ආයතනයකට රු.2,850,130 ක් ගෙවා තිබුණි.

(ඉ) මහව හා නිකවැරටිය අධ්‍යාපන කලාපවල පාසල් 06 ක සේවයේ නියුතු ගුරුභවතුන් 07 දෙනෙකු රජයේ සේවයේ වෙනත් තනතුරුවලට වර්ෂ 10 කට අධික කාලයක සිට මුදාහැර තිබුණද, ඉන් මහව කලාපයේ ගුරුභවතුන්ට රු. 16,999,058 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

(ඊ) පුත්තලම රෝහලේ සේවයේ යෙදී සිටියදී වැඩ තහනම් කරන ලද සෞඛ්‍ය කාර්යාල සහායකයකුගේ 2016 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල වැටුප් හා ඉකුත් මාසවල අතිකාල දීමනා රු.68,040 ක් අදාල සේවකයාගේ බැංකු ගිණුමට යවා තිබුණි.

6.8 හඳුනා ගන්නා ලද පාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය තත්ත්වයෙන් උසස් පළතුරු බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා වූ අවිධිමත් ටෙන්ඩරය මගින් රු. 1,155,000 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධයක්ෂ කාර්යාලයට වායු සමීකරණ යන්ත්‍ර මිලට ගැනීමේදී ප්‍රසිද්ධ ආයතනයකින් ඉදිරිපත් කරන ලද BG වෙළඳ නාමය සහිත වායු සමීකරණ යන්ත්‍ර භාවිතා කිරීමට පූර්ව අත්දැකීම් හා හුරු පුරුදු නොවීම, හේතු ලෙස දක්වමින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රතික්ෂේප කර තිබීම මත රු.181,930 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) හලාවත කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය ඉදිකිරීම සඳහා යෝජිත භූමියේ නිරවුල් තත්ත්වය විමසීමකින් තොරව රු.320,622 ක් වැයකර තිබුණු අතර, අදාල ඉඩම දේවස්ථානයකට අයත් බවට විරෝධතා මතුවීම හේතුවෙන් ඉදිකිරීම් අත්හැර දමා තිබුණි.

(ඇ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට IR Lamp 02 ක් මිලදී ගැනීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශය ලබා දීමේදී නඩත්තු පිරිවැය නොසලකා හැර තිබීම හේතුවෙන් රු.103,150 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඉ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ මත තෙවන අවම මිල ඉදිරිපත්කල ආයතනයෙන් වසර 05 ක නඩත්තු පිරිවැය සමඟ Ultra Sonic Scanner යන්ත්‍රයක් රු. 6,525,000 කට මිලදී ගෙන තිබුණි. එහෙත් සාධාරණ හේතු ඉදිරිපත් කිරීමකින් තොරව නඩත්තු පිරිවැය සමඟ රු.5,795,450 ක් වූ දෙවන අවම මිල ප්‍රතික්ෂේප කිරීමෙන් රු.729,550 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඊ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව Multipara Monitors 15 ක් මිලදී ගැනීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව එකී යන්ත්‍රවල නඩත්තු පිරිවැය සලකා බැලීමකින් තොරව කටයුතු කර තිබීම හේතුවෙන් සියලු තාක්ෂණික පිරිවිතරයන් සපුරා තිබූ ආයතනය නඩත්තු පිරිවැය සමඟ ඉදිරිපත් කල රු. 3,747,750 ක මිල ගණන් ප්‍රතික්ෂේප කර, නඩත්තු පිරිවැය සමඟ රු. 6,225,000 ක මිල ගණන් ඉදිරිපත් කල ආයතනයෙන් මිලදී ගැනීම හේතුවෙන් පළාත් සභා අරමුදලට රු. 2,477,250 ක පාඩුවක් සිදුවී තිබුණි.

6.9 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂය තුළ පළාත් ආයෝජන අරමුදල් යටතේ රු.1,809,500 ක් වූ ව්‍යාපෘති යෝජනා 66 ක් අනුමතවී තිබුණද, එයින් රු.762,619 ක් වූ ව්‍යාපෘති යෝජනා 28 ක් පමණක් 2016 නොවැම්බර් 02 දින වන විට නිමකර තිබුණි.

(ආ) නාරම්මල ප්‍රාදේශීය රෝහලේ පල්දෝරු පද්ධතියේ ඉදිකිරීම් රු. 2,604,337 ක් වැයකර 2012 සැප්තැම්බර් මාසයේදී අවසන්කර තිබුණද, නියමිත පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් නැවත 2016 වර්ෂයේදී රු.976,620 ක අමතර වියදමක් දරා අළුත්වැඩියාවක් සිදුකර තිබුණි. තවද 2012 සිට 2015 දක්වා අවස්ථා 06 කදී ගලි බවුසර් මගින් අපද්‍රව්‍ය ඉවත්කර තිබුණි.

(ඇ) කොටවෙහෙර ප්‍රාදේශීය රෝහල් පරිශ්‍රය ආවරණය වන පරිදි අලි වැටක් ඉදිකිරීම වෙනුවට 2015 වර්ෂයේදී රු.799,997 ක් වැයකර ඉදිකර තිබුණු යකඩ වැට වන අලි විසින් කඩා විනාශ කර තිබුණි.

(ඈ) වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම්ගත එකතුව රු. 27,051,186 ක් වූ කර්මාන්ත 08 ක ඉදිකිරීම් කටයුතු 2016 වර්ෂය තුල අවසන් කල යුතු වුවත්, 2017 පෙබරවාරි 21 දින වන විටත් එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි.

(ඉ) වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය තුල අවසන් කල යුතු ගිවිසුම්ගත වටිනාකම රු. 971,851,291 ක් වූ ව්‍යාපෘති 222 ක වැඩ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි.

6.10 ප්‍රමාද වූ ව්‍යාපෘති

------------------

කුලියාපිටිය ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී නිම කල යුතු රු. 16,271,695 ක් වූ කර්මාන්ත 08 ක් සම්පූර්ණයෙන්ම ඉටුකර නොතිබුණු අතර, කර්මාන්ත 03 ක් සඳහා රු. 81,939 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි.

6.11 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

2016 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය

-----------------------------------------------------------------

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,640 | 1,425 | 215 | - |
| තෘතියික මට්ටම | 559 | 374 | 185 | - |
| ද්විතියික මට්ටම | 9,593 | 7,999 | 1,594 | - |
| ප්‍රාථමික මට්ටම | 4,527 | 4,038 | 489 | - |
| වෙනත් | - | 120 | - | 120 |
| එකතුව | 16,319 | 13,956 | 2,483 | 120 |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| විදුහල්පති | 1,915 | 1,400 | 515 |
| ගුරුභවතුන් | 26,383 | 22,704 | 3,679 |
| සුළු සේවක | 2,696 | 2,483 | 213 |
| වෙනත් | 503 | 316 | 187 |
| එකතුව | 31,497 | 26,903 | 4,594 |

(ඇ) රෝහල් කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කාර්යාලීය කාර්යය මණ්ඩලය | 777 | 620 | 157 | - |
| රෝහල් කාර්යය මණ්ඩලය | 7,981 | 6,781 | 1,520 | 280 |
| එකතුව | 8,758 | 7,401 | 1,677 | 280 |

(ඇ) පළාත් පාලන ආයතන කාර්ය මණ්ඩලය

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 20 | 08 | - |
| තෘතියික මට්ටම | 48 | 14 | 34 | - |
| ද්විතියික මට්ටම | 1,297 | 905 | 392 | - |
| ප්‍රාථමික මට්ටම | 2,534 | 3,195 | - | 661 |
| වෙනත් | 13 | - | 13 | - |
| එකතුව | 3,920 | 4,134 | 447 | 661 |

(ඉ) ප්‍රඥප්ති මගින් පිහිට වූ ආයතන කාර්ය මණ්ඩලය (පළාත් සභා)

| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 21 | 14 | - |
| තෘතියික මට්ටම | 82 | 14 | 68 | - |
| ද්වීතියික මට්ටම | 196 | 158 | 38 | - |
| ප්‍රාථමික මට්ටම | 268 | 226 | 42 | - |
| වෙනත් | - | 46 | - | 46 |
| එකතුව | 581 | 465 | 162 | 46 |

මේ පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

6.11.1 පළාත් සභා හා පළාත්පාලන ආයතන (අධ්‍යාපන හා සෞඛ්‍ය හැර) කාර්ය මණ්ඩලය

(අ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත 250 ක කාර්ය මණ්ඩලයෙන් 75 ක සංඛ්‍යාවක් විධිමත් ස්ථාන මාරුවීම් ක්‍රමයකට යටත් නොවී එකම සේවා ස්ථානයේ වසර 05 කට වඩා වැඩි කාලයක් සේවය කරමින් පැවතුණි.

(ආ) පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ තනතුරු 10 කට අදාලව 32 ක ඌණතාවයක් පැවතුණි.

(ඇ) ප්‍රධාන ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලයේ තනතුරු 05 ක 16 දෙනෙකුගේ අතිරික්තයක් හා තනතුරු 24 ක 56 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.

(ඈ) ප්‍රාදේශීය සභාවල ලේකම් තනතුර සඳහා කළමනාකරණ සහකාර සේවයේ අධි පංතියේ නිලධාරීන් සිටිය යුතු වුවත්, ප්‍රාදේශීය සභා 18 ක් සඳහා පළාත් පාලන නිලධාරීන් 08 ක් වැඩ සටහන් සහකාරවරයෙක්, කළමනාකරණ සහකාර සේවයේ 04 ක් සහ සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ඉ) වයඹ පළාතේ පළාත් පාලන ආයතන 33 සඳහා අනුමත ආදායම් පරිපාලක තනතුරු සංඛ්‍යාව 105 ක් වුවද, 2016 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව 57 ක් විය. පළාත් පාලන ආයතන 02 ක අනුමත තනතුරු 05 ම පුරප්පාඩුව පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 06 ක් සඳහා නිලධාරීන් 80 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(උ) වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු නොකර විශ්‍රාමික කාර්මික නිලධාරීන්

06 දෙනෙක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා වැටුප් හා දීමනා සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේදි රු.1,482,397 ක් ගෙවා තිබුණි.

6.11.2 පාසල් කාර්ය මණ්ඩලය

--------------------------

(අ) ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ පාසල් 08 ක ගුරුභවතුන් 83 ක ඌනතාවයක් පැවතුණි.

(ආ) මහව අධ්‍යාපන කලාපයේ ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සිටිය යුතු පාසල් 35 ක අදාල ශ්‍රේණියට පහල ශ්‍රේණිවල විදුහල්පතිවරුද, පාසල් 43 ක සිටිය යුතු ශ්‍රේණියට වඩා ඉහල ශ්‍රේණිවල විදුහල්පතිවරුද, පාසල් 65 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරු වෙනුවට ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන්ද සේවයේ යොදවා තිබුණි.

(ඇ) හලාවත අධ්‍යාපන කලාපය තුළ නියෝජ්‍ය විදුහල්පති පුරප්පාඩු 48 ක් හා සහකාර විදුහල්පති පුරප්පාඩු 33 ක් පැවතුණි.

(ඈ) හලාවත අධ්‍යාපන කලාපයේ පාසල් 33 ක විදුහල්පති තනතුරේ වැඩ බැලීම සඳහා ගුරු සේවයේ ගුරුභවතුන් පත්කර තිබුණි.

6.11.3 සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය

-------------------------------------

(අ) වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 22 ක පුරප්පාඩු 213 ක් හා තනතුරු 04 ක 28 දෙනෙකු අතිරික්තව පැවතුණි.

(ආ) පළාත් ආයුර්වේද රෝහල් 10 ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 34 ක් සඳහා භෛසජ්ජක තනතුරු 16 ක් අනුමත කර තිබුණද 08 දෙනෙක් පමණක් බඳවාගෙන තිබූ අතර, සම්භාහනකරු තනතුරු 22 ක් සඳහා එක් අයෙකු පමණක් සේවයේ යොදවා තිබුණි.

(ඇ) පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමත සනීපාරක්ෂක කම්කරු තනතුරු 09 ක් වුවද 27 දෙනෙකු බඳවාගෙන තිබුණි. රෝහල් හා බෙහෙත් ශාලාවල කම්කරු පුරප්පාඩු 39 ක් පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකම සේවා ස්ථානයක වසර 10 ක සේවා කාලයක් ඉක්මවා සිටි හෙද නිලධාරීන් 380 ක් ස්ථාන මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් රාජ්‍ය සේවයට අන්තර්ගහනය කර ගැනීමකින් තොරව වෛද්‍යවරුන් 534 දෙනෙකු සේවයේ යොදවා තිබීම හේතුවෙන් කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් සෞඛ්‍ය ආයතන 46 ක වෛද්‍යවරුන් 80 ක අතිරික්තය හා රෝහල් හා සෞඛ්‍ය ආයතන 35 ක වෛද්‍යවරු 76 ක ඌනතාවය තුලනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඊ) කුලියාපිටිය මූලික රෝහලේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 07 ක 97 දෙනෙකුගේ අතිරික්තයක් හා තනතුරු 28 ක 168 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.

(උ) පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, ආයතන හා රෝහල් 29 ක වෛද්‍ය නිලධාරීන් 74 ක අතිරික්තයක් හා රෝහල් 11 ක වෛද්‍ය නිලධාරීන් 20 ක ඌණතාවයක් විය.

6.12 වාහන උපයෝජනය
----------------------
පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සතු පාවිච්චි කල නොහැකි වාහන 17 ක් දිරාපත්වීමට ප්‍රථම අපහරණය කර ගැනීමට පළාත් ප්‍රධාන ලේකම් වෙත වසරකට පමණ පෙර දන්වා තිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන 13 ක අලාභ හානි සම්බන්ධයෙන් රු.1,342,892 ක රක්ෂණ වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයට අයත් වාහනයක් 2015 මාර්තු 17 දින අනතුරකට ලක්වීම නිසා අලුත්වැඩියා වියදම රු.189,845 ක් වූ නමුත් රක්ෂණ වන්දි ප්‍රතිපූර්ණය රු.60,302 ක් විය. මේ අනුව රු. 129,543 ක් වූ පාඩුව රියදුරුගෙන් අයකර ගැනීමටදී තිබුණු නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ධාවනයෙන් ඉවත් කර තිබෙන වාහන 48 ක අපහරණ කටයුතු අදාල චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මාස 03 ක් තුල නිම කිරීමට පියවර ගෙන නොතිබුණි.

6.13 බැංකු සැසඳුම්

---------------

කුරුණෑගල සමූපකාර උපකොමසාරිස් කාර්යාලයේ 2000 ජනවාරි 01 දින සිට 2005 ජනවාරි 31 දින දක්වා කාලයට අදාල රු. 380,583 ක් වටිනා බැංකු ගත නොවූ ලැබීම් සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් කර ගෙන නොතිබුණි.

07. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

7.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

(අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු නොකර 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි.

(ආ) පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ විෂයයන් දෙකක් පමණක් ඇතුළත් කර තිබුණි.

7.2 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

7.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අමාත්‍යාංශයක, දෙපාර්තමේන්තු 03 ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාලව පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් කටයුතු සම්බන්ධයෙන් වියදමෙහි උපරිම සීමාව ඉක්මවීම රු.8,598,530 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 කට අදාලව ලැබීම්වල අවම සීමාවට ලඟා නොවීම් රු.12,560 ක් සහ අමාත්‍යාංශයක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාලව උපරිම හර ශේෂ සීමාව ඉක්මවීම රු.1,083,393 ක් විය.

08. පද්ධති හා පාලනය

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් පළාත් සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධතිය | පද්ධතියේ අඩුපාඩු |
|---|---|
| (අ) ආදායම් පාලනය | (i). ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම.<br>(ii). කපා හරින ලද පිරිවැටුම් බදු සම්බන්ධ මාසික වාර්තා පිළියෙල නොකිරීම.<br>(iii). දේපල බදු දීම මත වූ බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් කළමනාකරණය | (i). ජංගම නොවන වත්කම් ගිණුම්ගත නොකිරීම.<br>(ii). වත්කම් සම්බන්ධ වාර්ෂික සමීක්ෂණය සිදු කර නොතිබීම.<br>(iii). නිෂ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබීම.<br>(iv). අපහරණය කළයුතු වත්කම් සම්බන්ධයෙන් කටයුතු නොකිරීම. |
| (ඇ) මානව සම්පත් කළමනාකරණය | අතිරික්ත සහ ඌන කාර්යය මණ්ඩල සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබීම. |
| (ඈ) කොන්ත්‍රාත් පරිපාලනය | (i). අනුමත ව්‍යාපෘති නිමකර ගැනීමට කටයුතු නොකිරීම.<br>(ii). ප්‍රමිතියෙන් තොරව නිමකර තිබෙන කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගෙන නොතිබීම. |
| (ඉ) මිලදී ගැනීම් පාලනය | (i). තාක්ෂණික ඇගයීම් කමිටුවල සුදුසුකම්ලත් සාමාජිකයන් නොසිටීම.<br>(ii). පළාත් සභාවට වාසිදායක ලෙස මිලදී ගැනීම් සිදුකර නොතිබීම. |